# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී
# ජනරජයේ ගැසට් පත්‍රය

## 2023 නොවැම්බර් මස 03 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2023.11.07 දින නිකුත් කරන ලදී)**


# යොහාන් පතිරණ පදනම (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)

**යොහාන් පතිරණ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු උදයන කිරිඳිගොඩ මහතා විසින්
පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිස යි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# යොහාන් පතිරණ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

**පූර්විකාව**

යොහාන් පතිරණ පදනම යනුවෙන් සඳහන් කරනු ලබන පදනමක් එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ පදනමේ පරමාර්ථ හා ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය**

**1.** මේ පනත 2023 අංක     දරන ශ්‍රී ලංකා යොහාන් පතිරණ පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**යොහාන් පතිරණ පදනම සංස්ථාගත කිරීම**

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින්මතු ''පදනම'' යනුවෙන් සඳහන් කරනු ලබන) යොහාන් පතිරණ පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු බඳවා ගනු ලබන සියලු තැනැත්තන් (මෙහි මින් මතු ''සංස්ථාපිත මණ්ඩලය'' යනුවෙන් හඳුන්වනු ලබන) යොහාන් පතිරණ පදනම යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය භාවිත කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. එකී සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද, එකී නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය.

**සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ**

**3.** සංස්ථාපිත මණ්ඩලය සංස්ථාපනය කරනු ලබන්නේ කවර පරමාර්ථ සඳහා ද, ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) විනය හා සංස්කෘතික සාරධර්මයන් ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ආ) කාන්තාවන් හා ළමුන්ගේ සියලුම අයිතීන් ආරක්ෂා කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියා කිරීම;

(ඇ) ශ්‍රී ලංකාව තුළ ජීවත් වන සියලුම ජාතීන්ට සමගියෙන් හා සහජීවනයෙන් ජීවත් වීමට අවශ්‍ය සියලු උපදෙස් හා ආධාර ලබාදීම; සහ

(ඈ) ඉහත දැක්වෙන පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය හා විදේශීය සංවිධාන සමඟ සහයෝගීව කටයුතු කිරීම.

සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම

**4.** (1) සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු, සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන එකොළොස් දෙනකුට නොවැඩි සංඛ්‍යාවකගෙන් සමන්විත වූ කළමනාකරණ මණ්ඩලයක් විසින් මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත් කාලයේ පවත්නා රීතිවලට යටත්ව කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ සංවිධානයේ කළමනාකරණ කමිටුවේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල

**5.** බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදානයන් හා පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද, අරමුදල් කර ගැනීමේ ද, සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ, සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ එහි යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු හෝ දේවල් ඉටුකිරීමේ, ඉටුකිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට යටත්ව සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාපිත මණ්ඩලයේ රීති

**6.** (1) සංස්ථාපිත මණ්ඩලය විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන සියලුම කරුණු හෝ ඉන් කිසිවක් හෝ සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය:-

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, අස් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස් වීම;

(ආ) ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම, ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ධුරය හිස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම ඔවුන්ගේ බලතල, චර්යාව සහ වගකීම;

(ඇ) කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම සහ එහි බලතල, කාර්යය, චර්යාව සහ කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්ගේ ධුර කාලයන් ;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන්ගේ චර්යාව, කාර්ය, කර්තව්‍ය සහ බලතල;

(ඉ) කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම කැඳවීම සහ පැවැත්වීම, කාලවේලාවන්, ස්ථානයන්, එම රැස්වීම කැඳවීම පිළිබඳ දැන්වීම සහ න්‍යාය පත්‍ර, එම රැස්වීම්වල ගණපූරණය සහ එම රැස්වීම්වල දී සාකච්ඡා කළ යුතු කාරණා;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සහ එකී අරමුදල්වල භාරකාරත්වය, ගිණුම් පවත්වාගෙන යාම සහ විගණනය; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයට ම සහ එවැනි ම වූ රැස්වීමක දී සංස්ථාපිත මණ්ඩලය විසින් සාදනු ලැබූ යම් රීතියක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, එකතු කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත් විය යුතු ය.

**පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය**

**7.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි පදනමේ පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට සංවිධානයට අයවිය යුතු සියලු ණය සහ ලැබිය යුතුව තිබූ සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල**

**8.** (1) සංස්ථාපිත මණ්ඩලයට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, ප්‍රදාන, පරිත්‍යාග හෝ ආධාර මුදල් වශයෙන් මින් පෙර හෝ මින්මතු සියලු මුදල්, සංස්ථාවේ අරමුදල් වෙනුවෙන් කළමනාකරණ කමිටුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි එක් බැංකුවක හෝ බැංකු වැඩි සංඛ්‍යාවක, සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාපිත මණ්ඩලයේ බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන සියලු වියදම් පියවීම සඳහා අවශ සියලු මුදල් භාර අරමුදලින් ගෙවිය යුතු ය.

**සංස්ථාපිත මණ්ඩලය විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව**

**9.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් මඟින් හෝ අන්‍යාකාරයකින් සංස්ථාපිත මණ්ඩලය වෙත සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් බලය හා හැකියාව ඇති අතර, එකී සියලු දේපළ මේ පනතේ විධිවිධාන සහ සංස්ථාවේ 06 වැනි වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව, එකී දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ ඒ දේපළ අන්‍යාකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

**සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ**

**10.** සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ පදනමේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, පදනමේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

**ගිණුම් සහ විගණනය**

11. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම්, සභාවේ තීරණය කරන පරිදි සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ ''සුදුසුකම්ලත් විගණකවරයා'' යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) ගණකාධිකාරි ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරි ආයතනයක්,

අදහස් වේ.

සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව

**12.** සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව සංස්ථාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කවර වූ හෝ සාධන පත්‍රයකට තබනු නොතැබිය යුතු අතර, එකී තැනැත්තන් විසින් ඔවුන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**13.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**14.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.